කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

දුරකථන : 011 2686686
ෆැක්ස් : 011 2682668
විද්‍යුත් තැපැල : metnmc@gmail.com
වෙබ් අඩවිය : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** WW/L/18/07/12/01
වර්ණය : ඇම්බර්

# තද සුළං පිළිබඳව අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2018 ජුලි මස 15 වන දින ප. ව. 04.30 වන තෙක් වලංගු වන පරිදි
2018 ජුලි මස 12 වන දින ප. ව. 04.30 ට නිකුත් කරන ලදී.

## ගොඩබිම ප්‍රදේශ සඳහා

**සැලකිලිමත් වන්න!**

**දිවයින හරහා සුළඟේ වේගය වැඩිවීමේ හැකියාව තවදුරටත් පවතී.**

ඒ අනුව දිවයින හරහා විශේෂයෙන්, බස්නාහිර, දකුණු, මධ්‍යම, උතුරු, උතුරු-මැද සහ වයඹ පළාත් වලත් මොණරාගල දිස්ත්‍රික්කයේත් විටින් විට හමන පැ.කි.මී. 60 දක්වා ප්‍රභාරාත්මක සුළං (Gusty winds) බලාපොරොත්තු වේ.




**<u>බස්නාහිර, වයඹ සහ දකුණු වෙරළබඩ ජනතාව සඳහා</u>**

ජුලි මස 13 වන දින ප.ව. 02.00 සිට ජුලි මස 16 වන දින පෙ.ව. 08.00 දක්වා කාලයේදී පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ මීටර් 2.0 - 3.0 ක් පමණ (මෙය ගොඩබිමට පැමිණෙන රළ උස නොවේ.) ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා පොතුවිල් දක්වා වන වෙරළබඩ ප්‍රදේශවල මුහුදු රළ සුළු වශයෙන් ගොඩබිමට පැමිණීමේ හැකියාවක් (විශේෂයෙන් වඩදිය පවතින විටදී) පවතී.

වෙරළබඩ ජනතාව මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**වර්ෂාපතනය(මි.මී)** : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි
**මුහුදේ ස්වභාවය** : නිසල (0-5)පැ.කි.මී ,සුමට (5-15)පැ.කි.මී, සාමාන්‍ය ස්වභාවයෙන් යුතු (16-28)පැ.කි.මී, මද රළු (29-37)පැ.කි.මී, තරමක් රළු (38-46)පැ.කි.මී, රළු (47-55)පැ.කි.මී, ඉතා රළු (56-74)පැ.කි.මී, දළ රළු (75-102)පැ.කි.මී, ඉතා දළ රළු 103 පැ.කි.මී ට වැඩි.